රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2022

මගේ අංකය : EST-6/03/LEA/4000
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.09. 09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XII වැනි පරිච්ඡේදයේ වගන්ති සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1, 6, 8, 10, හා 21 වගන්තීන් කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම පරිච්ඡේදයේ 1 වගන්තියට 1:11 ලෙස නව උප වගන්තියක් ඇතුළත් කිරීමටත්, එම පරිච්ඡේදයේ 6:1:2, 8:2, 8:2:1, 10:1:4, 10:1:6 සහ 21:1 යන උප වගන්තීන් පහත පරිදි සංශෝධනය කිරීමටත් 2022.04.16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

1:11 යම් ලිත් වර්ෂයක ආරම්භක වැඩකරන දින සේවයට නොපැමිණෙන නිලධරයෙකුට නිවාඩු අනුමත කිරීමේ දී එම මුල් දිනය නව ලිත් වර්ෂයේ අනියම් හෝ විවේක නිවාඩුවලින් ආවරණය වනසේ අනුමත කළ නොහැක. එබඳු නිලධරයෙකුට නිවාඩු අනුමත කළ හැක්කේ පූර්ව වර්ෂයේ ඉතිරි විවේක නිවාඩුවලින් හෝ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 10 වගන්තියේ විධිවිධාන සපුරාලන්නේ නම් ඉකුත් නිවාඩුවලින් පමණි.

6:1:2 වෛද්‍ය සහතික පිළිබඳ උපදෙස් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර, වෛද්‍ය සහතිකයක් මඟින් ආවරණය වන කාලසීමා සඳහා මෙරට වැටුප් සහිත නිවාඩු අනුමත කිරීමේ දී, එම නිවාඩු කාලය තුළට ගැනෙන සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින (රාජකාරි ස්වභාවය මත සේවයේ යෙදීමට නියම කර නැති දින) අතහැර ගණනය කළ යුතු ය.

8:2 අවුරුදු දෙකක සමුච්චිත නිවාඩු එනම් නිවාඩු ලබාගන්නා අවුරුද්දේත්, ඊට කලින් අවුරුද්දේත් පාවිච්චියට නොගත් ඉතිරි විවේක නිවාඩු ලබා ගැනීමට ඔහුට ඉඩදිය හැකි ය. මේ අනුව වර්ෂයක් තුළ උපරිම වශයෙන් දින 48ක් හෝ සතියේ දින හතම සේවය කිරීමට නියමව ඇති නිලධරයෙකු සම්බන්ධයෙන් නම් උපරිම වශයෙන් දින 56ක් නිවාඩු ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබේ.

8:2:1 නිවාඩුව ගත කරන්නේ මෙරටින් පිටත දී නම්, නිවාඩු ලබා ගන්නා අවුරුද්දත් ඊට කලින් අවුරුදු දෙකත් යන අවුරුදු තුනේ සමුච්චිත විවේක නිවාඩු ලබා ගැනීමට මාණ්ඩලික නිලධරයෙකුට ඉඩදිය හැකි ය. මේ අනුව උපරිම වශයෙන් දින 72ක් හෝ සතියේ දින හතම සේවය කිරීමට නියමව ඇති මාණ්ඩලික නිලධරයෙකු සම්බන්ධයෙන් නම් උපරිම වශයෙන් දින 84ක් සමුච්චිත විවේක නිවාඩු ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබේ.

10:1:4 අනුගාමී වසර දෙකක් තුළ දී නිලධරයෙකුට දෙන ඉකුත් නිවාඩුවල එකතුව, වසර දෙකක ඔහුගේ සාමාන්‍ය නිවාඩු ප්‍රමාණය වන දින 48ක් හෝ සතියේ දින හතම සේවය කළ යුතු නිලධරයෙකු සම්බන්ධයෙන් නම් දින 56ක් නොඉක්මවිය යුතු ය.

10:1:6 මෙබඳු අවස්ථාවක දී අනුගාමී වර්ෂ දෙකක් ඇතුළත නිලධරයෙකුට දෙන ඉකුත් නිවාඩුවල එකතුව, අවුරුදු හතරක ඔහුගේ සාමාන්‍ය නිවාඩු ප්‍රමාණය වන දින 96ක් හෝ සතියේ දින හතම සේවය කළ යුතු නිලධරයෙකු සම්බන්ධයෙන් නම් දින 112ක් නොඉක්මවිය යුතු ය.

21:1 නිලධරයෙකුට, තම සාමාන්‍ය විවේක නිවාඩු අවසන්වීමෙන් පසුවත් නිලධරයාගේ අසනීපයක් නිසා හෝ විශේෂඥ වෛද්‍ය නිර්දේශයක් මත විශේෂයෙන් රැකබලා ගත යුතු අසනීපයකින් පෙලෙන දරුවකුගේ හෝ කලත්‍රයාගේ අසනීපයක් නිසා හෝ තවත් නිවාඩු අවශ්‍ය වුවහොත්, පහත සඳහන් විධිවිධානවලට යටත්ව ඔහුට අඩ වැටුප් නිවාඩු දිය හැකි ය.


එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : pubad.estad6@gmail.com